# ශ්‍රී ලාංකික වත්කම

## - ශ්‍රී ලංකා ඩිරෙක්ටරි

SRI LANKA DIRECTORY *in Australia*

පුරා දශක හතරකට වැඩි ශ්‍රී ලාංකිකයන්ගේ ඕස්ට්‍රේලියානු සංක්‍රමණ ඉතිහාසයේ එක් හිඩැසක් පුරවමින් ඕස්ට්‍රේලියා මහද්වීපයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලාංකික ව්‍යාපාර සහ සේවා දායකයින්ගේ මුද්‍රිත සහ අන්තර්ජාල දුරකථන නාමාවලියක් වසර 2010 දී එළි දැක්වීමට RSP Holdings සමාගම ඉදිරිපත් වී සිටී. මේ RSP Holding සමාගමේ රවින්ද්‍ර ශ්‍රී පණ්ඩිතරත්න මහතා සමඟ කළ සාකච්ඡා සටහනකි.

සන්නස - ශ්‍රී ලංකා ඩිරෙක්ටරි හි අදහස පැහැදිළි කළොත් ?

රවින්ද්‍ර - ඇත්තටම ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සහ අනෙකුත් ජාතීන් අතර පැහැදිළි වෙනස්කමක් මම දකිනවා. අපේ ප්‍රජාව ශ්‍රී ලංකාව සහ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් සෑහෙන කැප වීමකින් සහ උනන්දුවකින් සේවය කරනු ලබනවා. අනෙකුත් ජාතීන් තුළ නොදකින දියුණු සංකල්ප අපේ ප්‍රජාව තුළ දක්නට ලැබෙනවා. ඒ නිසාම බොහෝමයක් ව්‍යාපාර, ආගමික මධ්‍යස්ථාන, පුස්ථකාල, සංවිධාන ඔස්ට්‍රේලියාව තුළ ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලබනවා. එය අගය කරනු වස් 2008 වසරේ ජනවාරියේදී ඔස්ට්‍රේලියාවේ සිට විශ්වය පුරා මුදා හරින වත්කමක් ලෙසින් RAVSFM.COM නමින් වෙබ් අඩවියක් ආරම්භ කළා. ඒ ඔස්සේ ශ්‍රී ලාංකික ජනතාව අගය කිරීමේ ප්‍රවෘත්ති සහ වැඩසටහන් පෙළගස්වනු ලැබුවා. ඒ ඔස්සේ අපට වැටහී ගිය කාරණයක් තමයි ව්‍යාපාර සහ සේවාවන් සම්බන්ධව අංග සම්පූර්ණ පෙළගැස්වීමක් තවමත් අපට නොමැති බව. ඒ හේතුව නිසාවෙන්ම එම හිදැස පුරවන්නට අප විසින් ශ්‍රී ලංකා ව්‍යාපාර සහ සේවා නාමාවලියක් එළි දැක්වීමට අදහස් කළා.

සන්නස - ශ්‍රී ලංකා ඩිරෙක්ටරියේ අන්තර්ගතය ගැන කතා කළොත් ?

මෙමගින් මුළු මහත් ඕසට්‍රේලියාව පුරා ඇති ශ්‍රී ලාංකීය අනන්‍යතාව ඇති ව්‍යාපාර, සේවාවන්, සංවිධාන, ආගමික මධ්‍යස්ථාන, රේඩියෝ, රූපවාහිනී, පුස්ථකාල ගැන විස්තර ප්‍රාන්ත වශයෙන් බෙදා වෙන්කොට නිම කිරීමට අප බලාපොරොත්තු වෙනවා. ඒ අතරම මෙහි අන්තර්ජාල සංස්කරණයක් srilankadirectory.com.au යන වෙබ් අඩවියෙන් ලොව පුරා වෙසෙන ඕනෑම අයෙකුට ඕස්ටේලියාවේ ශ්‍රී ලාංකික ව්‍යාපාර දත්ත සැනෙකින් ලබා ගත හැකි පරිදි සකස් කිරීමටද අප විසින් කරනු ලබනවා.

සන්නස - මෙම නාමාවලිය හා ව්‍යාපාර සහ අනෙකුත් සංවිධාන සම්බන්ධ වන්නේ කෙසේද?

සියළුම ආයතන වල සහ ව්‍යාපාර වල විස්තර එම ආයතනවල අනුමැතිය ලැබීමෙන්

> **මම ආරාධනා කරනවා සියලුම ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකා ඩිරෙක්ට්‍රි වටා එක් රොක් වී අනෙකුත් ජාතීන් ඉදිරියේ අපගේ විශිෂ්ඨත්වය සහ අභිමානය මේ ඕස්ට්‍රේලියා මහද්වීපය තුළත්, ඉන් පිටතත් කුළු ගන්වන්නට එක්වන ලෙසට.**

අනතුරුව අප විසින් නොමිළයේම පෙළගස්වනු ලබනවා. මේ සඳහා මෙතෙක් ඇමතුමක් නොලද අය වෙතෙත් කරුණාකර 0421 455 535 දුරකතන අංකයට ඇමතුමක් ලබාදීම හෝ info@srilankadirectory.com.au ඊමේල් ලිපිනයට විස්තර දන්වා එවන ලෙස අප ඉල්ලා සිටිනවා. ඒ අතර ඩොලර් 25 සිට දැන්වීම් පළකිරීමටද ඔබට අවස්ථාව ඇති අතර එම දැන්වීම් මුද්‍රිත, අන්තර්ජාල සහ රේඩියෝ යන ත්‍රිවිධ මාධ්‍යයෙන්ම පාරිභෝ-ගික හවතුන් කරා ඵලදායී ලෙස ගෙන යාම අප විසින් කරනු ලබනවා.

සන්නස - බෙදා හැරීම ගැන කථා කළොත් ?

සියළුම ශ්‍රී ලාංකික වෙළඳ සැල් වලින්, සති අන්ත උස්සව අවස්ථා වලදී (Events) මෙම නාමාවලිය බෙදා දෙනු ලබනවා. වික්ටෝරියා ප්‍රාන්තයේ මෙන්ම අනෙකුත් ප්‍රාන්ත වලදීද අපගේ නියෝජිතයන් විසින් මෙම නාමාවලිය සෑම ශ්‍රී ලාංකකයෙකු අතටම පත් කිරීමට කටයුතු කරනවා.

සන්නස - මේ සඳහා දායක වන ඔබගේ පිරිවර ගැන කතා කළොත් ?

මේ කටයුත්තට උපදේශකාත්මක සහයෝගය මනෝවිද්‍යාචාර්ය්‍ය ප්‍රසන්න පණ්ඩිතරත්න මහතාත්, නිශාන්ත පණ්ඩිතරත්න මහතාත් ලබාදෙනවා.

මුද්‍රිත සංස්කරණයේ ග්‍රැපික් නිර්මාණ, පිටු සැකසුම ඇතුළු සියලු කටයුතු සාමන්ත තැන්නගේ ප්‍රමුඛ සාමාර්ට් ඩිසයින්ස් මගින් කරනු ලබනවා.

ඒ වගේම තුශාර හෙට්ටිආරච්චි සහ රන්මල් පෙරේරා අපගේ වෙබ් අඩවියේ ප්‍රවර්ධන (Promote) කටයුතු කරනු ලබනවා. ඒ මගින් ඕස්ට්‍රේලියානු සමාජයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව අනෙකුත් ප්‍රජාවන් අතර ශක්තිමත් ප්‍රතිරූපයක් ලෙස විද්‍යමාන වනු ඇත.

සන්නස - අවසාන වශයෙන් යමක් කීවොත්?

මම ආරාධනා කරනාවා සියලුම ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකා ඩිරෙක්ට්‍රි වටා එක් රොක් වී අනෙකුත් ජාතීන් ඉදිරියේ අපගේ විශිෂ්ඨත්වය සහ අභිමානය මේ ඕස්ට්‍රේලියා මහද්වීපය තුළත්, ඉන් පිටතත් කුළු ගන්වන්නට එක්වන ලෙසට.





# විශ්ව නර්ථන රේඛා ප්‍රසංගයෙන්

**Photos By**
**Prasanna Namal Kurukularathne**





